සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

පෙරදිග සංගීතය II
கீழைத்தேய சங்கீதம் II
Oriental Music II

**54 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගති කිහිපයකි.

A – ම ප නි ධ, ප ධ, ම ග රි ග ස

B – ම ප ධ ග̲, ම ග̲, ස ම ග̲ රි ස

C – ම ප ධ̲ ස්, නි ධ̲, ම ප ග̲ රි ස

(i) ඉහත රාග **තුන** හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 06 යි.)

(ii) එම රාග තුනෙන් කැමති රාගයකට අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඉහත (i) හි නම් කළ රාග තුනට අදාළ 'මේල' සහ 'ගානසම' වෙන් වෙන් ව එම රාගවල නම් සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

**2.** (i) නිර්දේශිත රාග තුනකට අදාළ ව සකසා ඇති පහත වගුවෙහි (A) සිට (F) දක්වා හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

| රාගය | මේලය | ජාතිය | වාදී ස්වරය | සංවාදී ස්වරය |
|---|---|---|---|---|
| භෛරව | භෛරව | (A) .................. | (B) .................. | රි̲ |
| ජයජයවන්ති | (C) .................. | (D) .................. | රි | ප |
| (E) .................. | බිලාවල් | ඖඩව | ස | (F) .................. |

(ලකුණු 06 යි.)

(ii) ඉහත වගුවෙන් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) භෛරව රාගය සහ කාලිංගඩා රාගය අතර සමානතා **දෙකක්** සහ විෂමතා **දෙකක්** බැගින් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ජයජයවන්ති රාගයට අදාළව මාත්‍රා **16**කින් යුත් තානාලංකාරයක් ලියන්න. (ලකුණු 02 යි.)

3. පහත හිස්තැන් සහිත ස්වර පේළි තුන හොඳින් නිරීක්ෂණය කරන්න. ඉන් දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අදාළ නිර්දේශිත ආරෝහණයන් හි **අසම්පූර්ණ** (හිස්තැන් හතර බැගින් වූ) ස්වර පේළි තුනකි.

A ස ___ ධ̣ ___ ස ම ___ ම ධ ___ සං

B ස රි ග ___ ___ ම ප ධ ___ ___ සං

C ස රි රි, ___ ග රි ස ___ ධ̣ ___ රි ___ ම ප නි සං

(i) A, B සහ C හි දැක්වෙන හිස්තැන්වලට අදාළ ස්වර යොදා, සම්පූර්ණ කරන ලද ආරෝහණ ස්වර පේළි A, B සහ C අක්ෂර යටතේ අදාළ රාගයන්හි නම ද සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) ඔබ විසින් නම කරන ලද රාග තුනෙන් කැමති රාගයකට අදාළ බඩාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඒක්තාලයෙහි ඨේකාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර, එම ප්‍රස්තාරය යටතෙහි ඉහත (i) කොටස සඳහා ඔබ විසින් නමකරන ලද රාග තුනෙන් කැමති රාගයක **අවරෝහණයෙහි** ස්වර, පිළිවෙළින් යෙදෙන ආකාරයට එක් ආවර්තයක් සම්පූර්ණ වන ලෙස අදාළ පරිදි මාත්‍රා ඇඳීම සහිත ව (යති/විශ්‍රාන්ති) ලියන්න. (ලකුණු 06 යි.)

## II කොටස

4. (i) ගැමි ගී සහ සේ ගී කරුණු **තුනක්** යටතේ සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

(ii) වැලපුම් ගී සහ අස්නේ ගායනා අතර පෙන්නුම් කෙරෙන සමානතා **දෙකක්** සහ අසමානතා **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) පහත කරුණු දෙකට අදාළව **විකා සී පදවලට** ආවේණික ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න.
- පද මාලාව
- නාද මාලාව

(ලකුණු 04 යි.)

(iv) "ගැමි ගීය නිර්ව්‍යාජ කලා මාධ්‍යයකි."

පැල් ගී, පතල් ගී සහ පාරු ගී යන ගී වර්ගවලින් **දෙකක්** තෝරාගෙන එම ගීතවල යෙදෙන පද මාලා ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න. (ලකුණු 06 යි.)

5. (i) පහත සඳහන් කරුණු පාදක කර ගනිමින් නූර්ති සහ නාඩගම් පිළිබඳව සංසන්දනාත්මක විස්තරයක් කරන්න.
- යොදාගැනෙන ස්වර වාද්‍ය භාණ්ඩ
- යොදාගැනෙන අවනද්ධ වාද්‍ය භාණ්ඩ
- ආභාසිත සංගීත සම්ප්‍රදායන්

(ලකුණු 06 යි.)

(ii) "උතුරු ඉන්දීය සංගීතයේ විකාශය සඳහා ගෝත්‍රික ගීත සහ පද්‍ය ප්‍රබන්ධවලින් ලද දායකත්වය බෙහෙවින් ඉවහල් විය."


ඉහත ප්‍රකාශය පිළිබඳව උදාහරණ දක්වමින් අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) උඩරට සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ගීත පිළිබඳව පහත සඳහන් කරුණු පාදක කරගනිමින් විස්තර කරන්න.
- නාද රටා සහ ස්වර පරාසයන්
- තාල ලක්ෂණ හා රිද්ම රටා

(ලකුණු 08 යි.)

## III කොටස

6.





(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයට අයත් ටයිම් සිග්නේචරය (Time signature) ලියන්න. (ලකුණු 02 යි.)

(ii) එම ස්වර ප්‍රස්තාරයෙහි පිළිවෙළින් යෙදෙන 3, 5, 6 සහ 7 විභාගවලට අදාළ ස්වර ප්‍රස්තාර කොටස් පෙරදිග ස්වර ප්‍රස්තාර ක්‍රමය අනුව පෙරළා, අදාළ අංක ද සමග වෙන් වෙන් වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) Pianissimo (පියැනිසිමෝ), Forte (ෆෝර්ටේ), Pizzicato (පිසිකාටෝ), Fortissimo (ෆෝර්ටිසිමෝ), Legato (ලෙගාටෝ) සහ Mezzo forte (මෙසො ෆෝර්ටේ) යන කරුණු (ප්‍රකාශන සංකේත) අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒ එකිනෙකට අදාළ සංකේත ද සමග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(iv) පහත දැක්වෙන ස්වර පාද තුනට ගැළපෙන බටහිර සංගීත කෝඩ්ස්, ප්‍රස්තාරයට අදාළ ලෙස විභාග යටතේ සලකුණු කරන්න.

| ස සග ප | ධ ම රි | නි̣ ප̣ නිරි | ස - - |

| ග ප ස් | නි - ප | ධ මරි ම | ග - ප |

| රි - ම | ග - ප | ම රි නි̣ | ස - - | (ලකුණු 06 යි.)

7. (i) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය චිත්‍රපට හතරකට අදාළ තොරතුරු කිහිපයකි. එම වගුවෙහි (1) සිට (8) තෙක් ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ අංකය ද සමග ලියා දක්වන්න.

| නිර්දේශිත චිත්‍රපටය | ගීතය | සංගීත අධ්‍යක්ෂ | ගායකයා/ගායිකාව |
|---|---|---|---|
| මාතලන් | කොවුලන් හඬයි | (1) .................. | ධර්මදාස වල්පොල |
| (2) .................. | ඕලු නෙලුම් නෙරිය රඟාලා | බී.එස්. පෙරේරා | (3) .................. |
| (4) .................. | ගලන ගඟකි ජීවිතේ | (5) .................. | නන්දා මාලිනී/ නාරද දිසාසේකර |
| (6) .................. | සිනිඳු සුදු මුතු තලාවේ | (7) .................. | (8) .................. |

(ලකුණු 08 යි.)

(ii) "ශ්‍රී ලංකාවේ ස්වතන්ත්‍ර චිත්‍රපට සංගීත නිර්මාණයේ සංධිස්ථානයක් ලෙස 'රේඛාව' චිත්‍රපටය සුවිශේෂී වේ." මෙම ප්‍රකාශය පිළිබඳ ව පහත සඳහන් කරුණු යටතෙහි අදහස් දක්වන්න.

- ගී තනු හා පද මාලා
- සංගීතය

(ලකුණු 06 යි.)

(iii) රාගධාරී සංගීත ආභාසයකින් නිර්මාණය වී ඇති නිර්දේශිත ව්‍යවහාරික සරල ගීතයක් නම් කර, ඒ පිළිබඳ ව පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඇගයීමක් කරන්න.

- තනු නිර්මාණය සඳහා පාදක වූ රාගය
- යොදා ඇති විවිධ රාගධාරී ශාස්ත්‍රීය අංග (තනුවේ පිහිටා ඇති ආකාරයට අනුව)

(ලකුණු 06 යි.)

**8.** (i) පහත පද රචනාවට උචිත තනුවක්, අ.පො.ස. උසස් පෙළට නිර්දේශිත රාගයක් ආශ්‍රය කරගනිමින් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කරන්න. නිර්මාණය සඳහා ආශ්‍රය කරගත් රාගයෙහි නම ද ලියන්න.

'පහන් දොරින් හිරු නැගෙන වෙලාවේ

නැවුම් හැඟුම් හද පුබුදු කරාවී' (ලකුණු 08 යි.)

(ii) ශ්‍රී ලාංකීය සංගීතවේදියකු විසින් 'සංධ්වනි' ආකෘතියට වඩාත් සමීප ලෙසින් සිදුකර ඇති සංගීත නිර්මාණයක් නම් කර, සංධ්වනි ආකෘතියට එහි ඇති සමීප බව පෙන්නුම් කිරීම සඳහා සුවිශේෂී කරුණු **තුනක්** යටතෙහි අදහස් දක්වන්න. (ලකුණු 08 යි.)

(iii) පහත කරුණු **දෙකක්** පිළිබඳ උදාහරණ දක්වමින් කෙටියෙන් හඳුන්වන්න.

(a) ගාන සමය

(b) හාර්මනි (Harmony)

(c) වන්නම

(ලකුණු 04 යි.)

❋ ❋ ❋

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න